සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

01 නොමනා ක්‍රියාවන්ට **උල්පන්දම් දීමෙන්** මුළු සමාජය ම දූෂිත වේ.
(1) විරුද්ධ වීමෙන් (2) රහසින් අනුබල දීමෙන්
(3) ප්‍රසාදය පළ කිරීමෙන් (4) ආලෝකයක් ලබාදීමෙන්

02 කළමනාකරුගේ **ගොළුබෙලි ගමන** නිසා නව ව්‍යාපෘතිය ආයතනයට අහිමි විය.
(1) මඟ නතර කිරීම (2) වරින් වර වැඩ කිරීම
(3) තරගකාරී බව (4) හෙමින් වැඩ කිරීම

03 ඕනෑම කාර්යයක දී **ඇඟ බේරා ගැනීම** ඇතමුන්ගේ සිරිතයි.
(1) උපායශීලී ව මඟ හැරීම (2) නිදහස් වීම
(3) තනිව ඉදිරිපත් වීම (4) පසෙක සිට උදව් දීම

- **අංක 04 සිට 06 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04 සාර්ථක කලා නිර්මාණයක් බිහිවන්නේ අත්දැකීම්වල මෙන් ම පරිකල්පනයේ ද ........................................ බව කිව හැකි ය.
(1) අධ්‍යනයෙන් (2) යෝග්‍යතාවයෙන් (3) පරිශීලනයෙන් (4) සංකලනයෙන්

05 උසස් අධ්‍යාපන ක්‍රමවේද අනුමත කළ එතුමා නව ප්‍රවණතාවල .................................. ලක්ෂණ උකහා ගත්තේ ය.
(1) සාධනීය (2) අදුරදර්ශී (3) දුබල (4) විශ්වසනීය

06 ජාතික නිදහස් අරගලයේ ............................................... සිහිගන්වමින් ගොඩනැගිලි නම් කිරීම සිදුකළේ ය.
(1) අගතිගාමීන් (2) විරුද්ධවාදීන් (3) පුරෝගාමීන් (4) අන්තවාදීන්

07 අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) වීරවිල, දූරණියගල, සීතාවක, පැලියගොඩ
(2) පිදුරුතලාගල, බතලේගල, හපුතලේ, හුන්නස්ගිරිය
(3) සිංහ, වානර, ගව, වලස්
(4) ගජබා, ගැමුණු, විජය, පැරකුම්

08 සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) වර්තමාන, ප්‍රගතිසීලී, බහුශ්‍රැතභාවය, ධාරානිපාත
(2) ළපලු, සමස්ථ, වාර්තාකරණය, එළි පෙහෙළි
(3) ජලාශ්‍රිත, වෛවර්ණ, රසාස්වාදය, ජාතිහිතෛෂී
(4) දෘෂ්‍යකාව්‍ය, කාර්‍යාලයීය, දේශාභිමානී, විශිෂ්ට



EXAMRESULTS.LK

09 ජීනමීන්, රූපය, ප්‍රසිද්ධ, මාවත යන වචනවල මුල් අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

(1) දීර්ඝ ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, රකාරාංශය, ඇලපිල්ල
(2) දීර්ඝ ඉස්පිල්ල, දීර්ඝ ඇදය, පාපිල්ල, ඇලපිල්ල
(3) දීර්ඝ ඉස්පිල්ල, කෙටි ඇදය, රකාරාංශය, ඇලපිල්ල
(4) ඇලපිල්ල, දීර්ඝ ඇදය, රකාරාංශය, කෙටි ඇදය

10 තාලුජ අක්ෂර පමණක් යෙදී ඇති පදය තෝරන්න.

(1) රළ (2) ජය (3) තද (4) බඹ

11 උක්ත නාමපද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?

(1) ගායිකාවක්, දරුවන්, සමහරු, සතෙක් (2) මගීහු, ධීවරයෙක්, ශිෂ්‍යයන්, ඇතෙක්
(3) තා, ඔවුහු, සමහරු, දරුවෝ (4) සතුරෝ, කෘමීහු, සෙබලෙක්, තොපි

12 ''සමාජ සේවකයෝ සිසුන්ට මුව ආවරණ බෙදා දුන්හ'' යන වාක්‍යයේ 'සිසුන්ට' යන්නෙහි විභක්ති කුමක් ද?

(1) සම්බන්ධ (2) කර්ම (3) අවධි (4) සම්ප්‍රදාන

13 'දුසිරිත්'' යන පදය අයත් සමාස වන්නේ,

(1) විභක්ති සමාසයට ය. (2) අන්‍යාර්ථ සමාසයට ය.
(3) අව්‍ය සමාසයට ය. (4) විශේෂණ සමාසයට ය.

14 පහත දැක්වෙන පද අතුරින් තද්ධිත පදයක් නොවන්නේ,

(1) සුරක්ෂාව (2) නවීනතම (3) පුරාතන (4) රචනාමය

15 මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) කෘදන්ත - සෑදෙන, කරනා, නටන්නා, සිතීම (2) පූර්ව ක්‍රියා - ගොස්, දමා, කර, බලා
(3) සන්ධි - ගිරඟ, අත්තෙන්, අතිනත, බියකරු (4) සමාස - දුකසැප, පොල්තෙල්, අතිනත, දිනකර

16 මිශ්‍ර ක්‍රියාවක් යෙදී ඇති වාක්‍ය කුමක් ද?

(1) ඔවුන් වනාන්තරය ආසන්නයට යද්දී බිය සහිත හඬක් ඇසුණි.
(2) අතීතයේ තරු ලකුණු බල බලා කාන්තාර තරණය කර ඇත.
(3) ස්වාමියා සේවකයා ලවා මාර්ගය පිරිසිදු කරවයි.
(4) ඒ ස්ථානයට නොයනු මැනවි.

- **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

17 රචනා ලිවීම, ලේඛන කුසලතා වර්ධනයට **ඉවහල් වන** ක්‍රියාකාරකමකි.

(1) උදව්වන (2) වහල්වන (3) පසුනොබසින (4) යටත්වන

18 සිය දේශසීමාව **අතික්‍රමණය** කළ ඔහු කලා කටයුතුවලින් තම රටට කීර්තියක් ගෙන දුන්නේ ය.

(1) ඇල්මක් දැක්වීම (2) සමකිරීම (3) ආසන්නයට යාම (4) ඉක්මවායාම

19 එම ග්‍රන්ථය පිළිබඳ **සංක්ෂිප්ත** විග්‍රහයක් අවසානයේ දැක්වේ.

(1) කෙටි (2) දීර්ඝ (3) සවිස්තර (4) තැනින්තැන

20 දී ඇති වචන ගොනු අතරින් අන්‍යෝන්‍ය වශයෙන් සමීප බවක් නොපවත්නා පද පේළිය තෝරන්න.

(1) ප්‍රස්තාව පිරුළු, රූඪී, ආප්තෝපදේශ, යුගලපද
(2) ශෘංගාර, අද්භූත, වීර, හාස්‍ය
(3) රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත, පරිගණකය
(4) රකාරාංශය, රේඵය, ඇලපිල්ල, ස්වරය

21 එක් පද පේළියේ දී ඇති පදවලට විරුද්ධ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) නිෂ්ඵල - සඵල, බහුල - විරල, මිත්‍ර - ශත්‍රු, විරති - සුගති
(2) සිනිඳු - ගොරෝසු, සත්පුරුෂ - අසත්පුරුෂ, ඓහලෞකික - පාරලෞකික, ආමිස - නිරාමිස
(3) ආවරණ - අනාවරණ, ආර්ය - අනාර්ය, ආගන්තුක - නේවාසික, ආලය - ආදරය
(4) චල - නිශ්චල, මන්ත්‍රණ - සම්මන්ත්‍රණ, ආනයන - අපනයන, අහංකාර - ආඩම්බර

22 මුලින් දී ඇති පදයට සමානාර්ථයක් <u>නොදෙන</u> පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) අශ්වයා - හය, තුරඟ, අස්, ගිජිඳු (2) කොණ්ඩය - වරලස, කෙහෙ, කියඹු, මුහුලස
(3) උත්සාහය - ප්‍රයත්නය, ආයාසය, යත්න, තැත (4) ආලෝකය - එළිය, අලු, කාන්ති, ප්‍රභාව

23 විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) අන්ත - අනන්ත (2) ගැටලුව - විසඳුම (3) කැළැල් - නිකැළැල් (4) විකල්ප - සංකල්ප

24 වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) ඇයි ? කෙසේද ? කවදා ද? වැනි ප්‍රශ්නවාචී යෙදුම් හා බැඳෙන නාම පද අනුක්ත රූපයෙන් සිටී.

(2) තමාගේ දරුවන් හැඳින්වීමේ දී 'මා' හෝ 'මය්' යන්නක් යෙදීම මොනරාගලට හුරු ව්‍යවහාරයකි.

(3) ඉංග්‍රීසි, අරාබි භාෂාවලින් සිංහල භාෂාවට පැමිණ ඇති තත්සම වචනවල 'ෆ' අක්ෂරය යෙදේ.

(4) බහු + අර්ථ සන්ධි වනුයේ බහුවර්ථ යනුවෙනි.

25 පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

(1) සෞරග්‍රහ මණ්ඩලයේ ඉතාමත් අභ්‍යවකාශයේ සිට බලන විට අලංකාර ග්‍රහලෝකය වශයෙන් පෙනෙන්නේ පෘථිවියයි.

(2) කාර්යබහුල ජීවිතයක් ගත කළ නමුත් ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් සිය දැනුම ලෝකයා වෙත ප්‍රදානය කරනු සඳහා ග්‍රන්ථ ගණනාවක් ලියා පළ කිරීමට සමත් විය.

(3) පැවිදි ලේඛකයන්ගේ කෘතිවලට ඇතැම් මාතෘකා සාමාන්‍යයෙන් විෂය නොවූ ගිහි ලේඛකයෝ තම රචනාවලට වස්තු කොට ගත්හ.

(4) ගෝලීයකරණය සමග සන්නිවේදන කාර්යය පහසුකිරීමේලා ඇති වී තිබෙන නව විපර්යාස හමුවේ මෙවැනි නව තාක්ෂණ මෙවලම් මහෝපකාරී වෙයි.

- **අංක 26, 27 ප්‍රශ්න යටතේ දී ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.**

26 ''කළ නොහැක්කක් වෙනුවෙන් වෙහෙස ගැනීමක්''

(1) කණ කැස්බෑවා විය සිදුරෙන් අහස දකින්නා වගේ

(2) කටින් බතල දඬු හිටවන්නා වගේ

(3) ගොළුවා දැකපු හීනේ වගේ

(4) කණාමැදිරි එළියෙන් නිදන් සොයන්නා වගේ

27 ''අනවශ්‍ය දෙය කතා කරන්නට යාමෙන් අමාරුවේ වැටෙයි.''

(1) මාළුවා නහින්නෙ උගේ කට හින්දලු (2) මෝල්ගස් ගිලපු පිඹුර වගෙයි

(3) වඳින්න ගිය දේවාලේ හිසේ කඩා වැටුණා වගේ (4) හොරාගේ අම්මගෙන් පේන අහන්නා වාගේ

28 පරස්වර ලෝප සන්ධියට හා ස්වරාදේශ සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

(1) දෑස, සුරඟන (2) සියැසින්, දෑස (3) සුරඟන, දෑස (4) සියැසින්, සුරඟන

- **අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.**

29 (1) ළමයෙක් කථාවක් පවත්වනු ඇත. (2) සිංහයා පැටවුන් සමග ලෙන තුළට ගියේ ය.

(3) අපි සියල්ලන් ම ශ්‍රී ලාංකිකයෝ වෙමු. (4) ඔවුහු තුමූ ගමට ගියේ ය.

30 (1) ඔවුන් ක්‍රීඩා කරති'යි අපි සිතුවෙමු. (2) ගුරුවරු ද ශිෂ්‍යයින් ද රැස්වීමට ආහ.

(3) ඔවුහු තෙමේ ගමට ගියහ. (4) මම හෙවත් අක්කා මල් කඩයි.

31 * <u>දරුවන්</u> විසින් දෙමව්පියෝ නැමදෙති.

* මිනිසුන් විසින් <u>සත්තු</u> ආරක්ෂා කෙරෙති.

* නංගී <u>අත සෝදා</u> බත් කෑවා ය.

* මල්ලී රූපවාහිනිය <u>බලබලා</u> බත් කයි.

ඉහත වාක්‍යවල ඉරි ඇඳි පද හැඳින්වීමට යොදන ව්‍යාකරණ විදිය දැක්වෙන අනුපිළිවෙළ කුමක් ද?

(1) උක්ත කර්මය, අනුක්ත කර්තෘ, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(2) අනුක්ත කර්තෘ, උක්ත කර්මය, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(3) උක්ත කර්මය, අනුක්ත කර්තෘ, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා

(4) අනුක්ත කර්තෘ, උක්ත කර්මය, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා

32 පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත්ම නිවැරදි වන්නේ කුමක් ද?

''එයාල අපිත් එක්ක තරහ වුණා''

(1) ඔවුන් අපත් සමග තරහ වූහ. (2) ඔවුහු අපිත් සමග තරහ වුණෙමු.

(3) ඔවුන් අපිත් සමග තරහ වුණෙමු. (4) ඔවුහු අපත් සමග තරහ වූහ.

33 ආචාර්ය ජයලත් මනෝරත්නයන් විසින් රචනා නොවූ නාට්‍යයක් වන්නේ,

(1) අන්දරේලා (2) ගුරුතරුව (3) වතුරමල (4) කනේරු මල්

34 පහත ගද්‍ය පාඨවලින් උපමාවක් රහිත ගද්‍ය පාඨය තෝරන්න.

(1) ''අනන්තාපරිමාණ සක්වළ සත්වයන් කෙරෙහි කරන්නා වූ මෛත්‍රිය මහබිජුවකට මහමෙර පෙරළන්නා සේ එක ඇත්හු කෙරෙහි පතුරුවා....''

(2) ''කන හුණු මිහිරි හඬින්, ඇසැ හුණු බුදු රුවින් කෙශර සිංහයක්හු දුටු ඇත්පොව්වෙකු සේ අනෙකක් සිතිය නොහී...''

(3) මහපොළොව තෙමේ මැ කුඹල් සකක් සෙ පෙරළා පස්සෙහි ලා පී යැ

(4) බුදු රුවට දල්වාලූ ඇස පියාලියැ නොහී, ඒ රූ අමා ඇසින් උකා බොමින්

35 සාහිත්‍යකරුවා යොදා ගන්නා භාෂාවේ විශේෂ ලක්ෂණය හැඟීම් දනවීමේ ශක්තියයි. එය කුමන නමකින් හැඳින්වේ ද?

(1) භාවික ගුණය (2) පද සංඝටනය (3) ව්‍යුත්පත්තිය (4) සතතාභ්‍යාසය

36 පහත සඳහන් කවියෙහි හතරවැනි පදය තෝරන්න.

ඔබ මහ මුහුද මැද තනියම වෙසෙන කල
සිහියට නැගෙනු ඇත මෙහි මා නිදන පැල
හිමියනි ඔබට මගෙ හදවත මිහිරි කළ
..............................................................................................

(1) දෙසවන වැටෙන විට කිසිවකු හඬන කළ (2) සැනසුම තිබේ මේ පොල් අතු කුටිය තුළ

(3) මා නොදනුවත්ව ම මම මගෙ දෙපය තුළ (4) සුළඟේ මැකී යයි මගෙ දුක්මුසු තාල

37 ලංකා ලංකා පෙම්බර ලංකා
පිනවමු ඔබ ලංකා
හොබවමු ඔබ ලංකා
දිවි දී
සුරකිමු ඔබ ලංකා

ඉහත සඳහන් ගීතය ගායනා කරන ගායකයා වන්නේ,

(1) පණ්ඩිත් අමරදේව මහතා (2) එඩ්වඩ් ජයකොඩි මහතා

(3) සුනිල් සාන්ත මහතා (4) ටී. එම්. ජයරත්න මහතා

38 ධීවර බස් වහරේ දී ''ජම්පර කළුව'' ලෙස අර්ථ දක්වන්නේ කුමකට ද?

(1) දැල (2) වැහි කබාය (3) කුඹ ගස (4) යොත

39 මැටි ගොඩ අනා සකපෝරුවෙ තියන්නේ
අතකින් කරකවා ගෙන ඉදි කරන්නේ
කැලයෙන් දර සොයාගෙන ගිනි පිඹින්නේ
කවුරුද මහතුනේ මගෙ දුක දකින්නේ

යන කවියෙන් කියවෙන්නේ

(1) ගඩොල් කර්මාන්තය (2) රෙදි මැසීම ගැන

(3) පැල් රැකීම ගැන (4) වළං කර්මාන්තය ගැන

40 පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

''ශ්‍රී ලංකාවේ සිංහල වර්ගයාගේ ආරම්භය ඇති වූයේ ක්‍රි.පූ. හයවැනි සියවසේ දී පමණ වෙළහෙළඳාම් ආදිය සඳහා වරින් වර ඉන්දියාවෙන් පැමිණ ජනාවාස පිහිටුවාගත් ආර්යයන් ගෙනැ'යි යනු සාමාන්‍යයෙන් පිළිගත් මතය වේ.''

(1) ක්‍රි.පූ. හයවැනි සියවසේ දී පමණ වෙළහෙළඳාම ආදියට ඉන්දියාවෙන් පැමිණ ජනාවාස පිහිටුවාගත් ආර්යන්ගෙන් සිංහල වර්ගයා ආරම්භ වුණ බව සාමාන්‍ය පිළිගැනීමයි.

(2) සිංහල වර්ගයාගේ ආරම්භය වෙළහෙළඳාම් සඳහා ඉන්දියාවෙන් පැමිණි ආර්යයන්ගෙන් බව සාමාන්‍ය පිළිගැනීමයි.

(3) සිංහල වර්ගයාගේ ආරම්භය ක්‍රි.පූ. හයවන සියවස දී වෙළඳාම් සඳහා මෙරටට පැමිණි විදේශිකයන්ගේ බව සාමාන්‍ය පිළිගැනීමයි.

(4) ඉන්දියාවෙන් පැමිණ ජනාවාස පිහිටුවාගත් ආර්යයන්ගෙන් සිංහල ජාතිය ආරම්භ විය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

(01) අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

(අ) අග (ආ) අඟ

(ii) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.

(අ) මුංපියළි (ආ) සමුපකාරය

(iii) පහත සඳහන් වාක්‍යවල අතුළත් තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියාපද වර්ග ලියන්න.

(අ) **කරව** පියාසර සකි කොන්තගන් තොටින්

(ආ) පාරේ පයින් **යනවිට** දකුණින් යන්න

(iv) පහත සඳහන් පද සඳහා විරුද්ධාර්ථ පද ලියන්න.

(අ) උත්සන්න (ආ) කඨෝර

(v) පහත සඳහන් වාක්‍ය සදොස් ය. නිදොස් කර ලියන්න.

(අ) දුවැන්ත අලියෙකු අනුරාධපුර පුත්තලම් මාර්ගයේ පාර හරස්කොට ගෙන සිටියේ ය.

(ආ) මධ්‍යස්ථ පාලකයෙක් පහළ වෙත්වා !

(vi) පහත දැක්වෙන නාම පදවල ඇතුළත් වන තද්ධිත ප්‍රත්‍ය වෙන්කොට ලියන්න.

(අ) නෛතික (ආ) ඉඟටි

(vii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) අනුන් විසින් පෝෂණය කළ (ආ) තමන්ගේ මතයේ ම එල්බගෙන සිටින

(viii) පහත සඳහන් යෙදුම්වල පළමු හෝ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවැනි වචනය සකස් කොට ලියන්න.

(අ) ධර්ම සබය (ආ) ශිලා ලිපි

(ix) පහත සඳහන් වාක්‍ය දෙක කර්මකාරකයට හරවා ලියන්න.

(අ) දඩයක්කරුවා සාවා ද මුවාද මරයි. (ආ) වෛද්‍යවරියක් රෝගියා සුවපත් කළා ය.

(x) පහත දැක්වෙන වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

''වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වූවන් ට ඖෂධ සැපයෙන්නේ සෞඛ්‍ය දෙපාර්ථමේන්තුවෙන් ය.''

(02) පහත දැක්වෙන ''අ, ආ, ඉ, ඊ'' යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ශ්‍රී ලංකාව කෘෂිකර්මාන්තය සඳහා විශාල භූමි ප්‍රමාණයක් යොදවයි. වී, පොල්, රබර් ආදී වගා මෙන් ම එළවළු, පලතුරු වගා සඳහා ද වැඩි භූමි ප්‍රමාණයක් යොදවා ඇත. නමුත් මෙම ගොවිතැන්වල නියැලෙන ගොවියා මෙම වගාවන් තුළින් ප්‍රමාණවත් ආදායමක් නොලබයි. නවීන තාක්ෂණය හා බෝග විවිධාංගිකරණය තුළින් කුඩා බිම් ප්‍රමාණයකින් විශාල ආදායමක් ලබාගත හැකි කෘෂි ආර්ථිකයකට නැඹුරු වීමට කාලය එළඹ ඇත. ලෝක වෙළෙඳ පොළේ ඉල්ලුමක් පවතින විවිධ කෘෂි බෝග ප්‍රවර්ධනය වඩා යෝග්‍ය වේ.

(ආ) කාලගුණික විපර්යාස මෑතක සිට කථාබහට ලක්වන මාතෘකාවක් වෙයි. කාලගුණික විපර්යාස ඇතිවීමට මිනිසාගේ ක්‍රියාකාරකම් කොතරම් දුරට බලපානවා ද යන්න කතාබහට ලක්ව ඇත. නිරන්තර ඇතිවන ගංවතුර හා නියඟ තත්ත්වයන් ද කාලගුණික විපර්යාස අතර කැපී පෙනේ. මේ සියල්ල වැරදි මිනිස් ක්‍රියාකාරකම්වල අහිතකර ප්‍රතිඵල වෙයි. ඉදිරි ලෝකයාට කාලගුණික වෙනස්වීම්වලට අනුව ජීවත් වීමට සිදුවනු ඇත.

(ඉ) ශ්‍රී ලංකාව ස්වභාවධර්මයේ පාරාදීසයකි. රටවටකර තිබෙන මනරම් වෙරළතීරය ද සීත දේශගුණික හා දිය ඇළි සහිත මධ්‍යම කඳුකරය ද, විවිධ වනෝද්‍යාන ද, පුරාවිද්‍යා හා ඓතිහාසික ස්ථාන ද ලොව සැම සියලු දෙනාගේ ම ආකර්ෂණය දිනා ගනියි. එමෙන් ම ආගන්තුක සත්කාරය, දේශීය වෙදකම, දේශීය ආහාර, විවිධ උත්සව තවත් රට විචිත්‍රවත් කරයි. මෙවැනි විචිත්‍රවත් වූ රටකට සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට විධිමත් වැඩ පිළිවෙළක් අවශ්‍ය වේ.

(ඊ) රටක සංවර්ධනය ගැන සැලකීමේ දී මනුෂ්‍යයාගේ භෞතික හා ආධ්‍යාත්මික යන අංශ දෙක ම වැදගත් වේ. එහෙත් බොහෝ දෙනා යොමු වන්නේ භෞතික සංවර්ධනය කෙරෙහි පමණි. මේ නිසා බාහිර වශයෙන් පුද්ගල සංවර්ධනය කිරීම ඔවුන්ගේ අරමුණයි. කෙසේ වෙතත් මෙහි දී වඩාත් වැදගත් වන්නේ මිනිසාගේ ආධ්‍යාත්මික සංවර්ධනයයි. මේ අනුව මිනිසා හදා රට සංවර්ධනය කිරීම ගැන රජයේත් පෞද්ගලික අංශයේත් අවධානය යොමුවිය යුතු ය.

(03) පහත දැක්වෙන පාඨය වචන 50-60 අතර ගණනකින් යුක්ත වනසේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශයේ අග යොදන්න.

දකින්නට සුදුසු හෙයින් දෘශ්‍ය කාව්‍යය නමින් හැඳින්වෙන කාව්‍යයන්ට නාටක යයිද කියනු ලැබේ. සහෘද සිත් පිනවා රස විඳවීමට නාටක සමත් ය. කවිත්වයේ ප්‍රධාන ඵලය නාටකය යි. කවිත්වය, නාටකය අන්තිම සීමාව කොට ඇතැයි කීවේ එහෙයිනි. නාට්‍යයේ 'සර්ව වර්ණකවේද නාමයෙන්' භාරත හඳුන්වයි. සෙසු වේද බමුණන්ට සීමා වෙනත් නාට්‍යවේදය වර්ණ භේද නොසලකා පොදුවේ කාටත් පරිශීලනය කළ හැකි පංචම වේදයකි. දුර්වලයන්ගේ හද ප්‍රබල කිරීමටත්, ශූර වීරයන්ගේ හදෙහි ශූරවීරනාමයන් උද්දීපනය කිරීමටත්, අඥානයන්ට නුවණ දීමටත්, විද්වතුන්ගේ පාණ්ඩිත්‍යය උත්කර්ෂවත් කිරීමටත් නාටකය සමත් ය. ලෝක වෘත්තයන්ගේ අනුකරණය නාට්‍යයේ දක්නට ලැබේ. ලෝකයේ සියලු විෂය නිරූපණය කිරීම නාට්‍ය සතු කාර්යයි. භරතමුනි කියන්නේ නාට්‍යයෙහි දක්නට නොලැබෙන ඥානයක් ශිල්පයක්, විද්‍යාවක්, කලාවක් නැති බවය.

මිනිසාට අනුකරණය සහජයෙන් ම උරුම වූවකි. මේ අනුකරණය කිරීමේ ආශාව නිසා බිහි වූ කලාවක් හැටියට නාට්‍යය දැක්විය හැකිය. ආදිම මනුෂ්‍යයා දඩයමින් ජීවත් වූ අතර හැඟීම් අංග චලනයෙන් ප්‍රකාශ කරමින් සතුන්ගේ ක්‍රියා අනුකරණය කොට දක්නට ඇත. නාට්‍යයේ මුල් ම අවස්ථාව මේ අනුකරණය යි.

නාට්‍ය කලාව ආගමට සම්බන්ධ කිරීමට බොහෝ විචාරකයෝ කැමැති වෙති. එහෙයින් නාට්‍යයේ මූල බීජය ආගමික පුද පූජාවල ඇතැයි සිතිනි. පූජා පැවැත්වූ පූජකයා නළුවා හැටියටත් මහජනයා ප්‍රේක්ෂකයන් හැටියටත් ගෙන ප්‍රථමයෙන් ආගමික නාට්‍යයක් ඇති වූවා යයි සිතති. (ලකුණු 10)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

සිංහල සංස්කෘත පාලි වැනි භාෂා හා සමීප සම්බන්ධතාවයක් ඇති නමුත්, එය සතු මගධ, බස්වලින් පහළ වූවක් ද, නැතහොත් එකී භාෂාවන් හා සමාන්තර වර්ධන ඔස්සේ විකාශනය වූවක් ද යන්න එකහෙළා ම කීම අසීරු ය. සිදත් සඟරාවේ ඇති දුබලතාවයට ප්‍රධාන හේතුව වන්නේ මෙම ඓතිහාසික සම්බන්ධය ගැන පැවති පූර්ව විනිශ්චයන් නිසා බැව් සමහරුන්ගේ මතයයි. රැපියල් තෙන්නකෝන් මේ ගැන පවසනුයේ ''මෙහි පිළිවෙළ අවුල් වී යාමට මුල් මැ කරුණ ලෙස පෙනෙන්නේ සිදත්සඟරා කරුවනුත් සෙසු බොහෝ පඬුවන් සේ මැ එළු, මගධ, සකු යන දෙබසින් පහළ වූවකි යන ගැහීම ඇතිව සිටීමයි'' යනුවෙනි.

මෙම මතය සිදත්සඟරා සන්න කරුවන් හා නූතන විවරණ ආදියේ ඇති අර්ථකථනයක් මිස සිදත්සඟරාකරුගේ මතයක් නොවී ය. සිදත් සඟරා කතුවරයා එබඳු මතයක පිහිටියෙකු වී නම්, සිංහලයේ හෝඩිය ද සංස්කෘත හෝඩිය ම ලෙස දක්වන්නට ඉඩ තිබුණි. මන්දයත්, මිශ්‍ර සිංහල ගද්‍ය ව්‍යාකරණයෙහි සංස්කෘත වර්ණමාලාවේ අක්ෂර භාවිත වූ බැවිනි. ''සියබසට'' වියරණයක් ලිවීමට එළඹෙන සිදත්කරු එසේ කරන්නේ එය යම් ස්වාධීන ලක්ෂණ ඇති බසක් වශයෙන් සලකාගෙන ය. මෙහි යථාතත්ත්වය පිරික්සා බලන කල පෙනී යන්නේ සංස්කෘත භාෂාවේ මහත් බලපෑම ඔස්සේ යටපත් වෙමින් තිබූ හෙළ බසේ ලකුණු පහදා දීම කතුවරයාගේ අරමුණ වූ බවයි. ඒ හෙළ බස් ලකුණු සිදත ලියන විට වඩාත් මැනවින් ආරක්ෂිත ව පැවතියේ ගද්‍යයෙහි නොව පද්‍ය ව්‍යවහාරයෙහි ය, හෙවත් කව්ලැකියෙහි ය. කව්ලැකියෙහි වියරණ ලකුණු විධිමත් ව පිරීක්ෂා බැලීම සම්බන්ධයෙන් විමසීමේ දී සිදත් සඟරාවේ කෙතරම් දුර්වලතා පැවතිය ද කතුවරයාගේ මූලික ධාරණාව වූයේ සංස්කෘත මිශ්‍ර ගද්‍ය ව්‍යවහාර සලකා බැලීම නොව එම ආයතනයෙන් කැළැල් නොවූ හෙළ බස් ලකුණු කියා පෑම බැව් පෙනේ.

ඒ අනුව විසිවැනි සියවසේ කුමාරතුඟුවන් සංස්කෘත ආදිපත්‍යයෙන් සිංහලය මුදවා ගැනීමට ගත් උත්සාහයට සමාන උත්සාහයක තෙළෙස්වැනි සියවසේ සිදත්කරුවෝ ද යෙදුණ හ. එහෙයින් සිදත්සඟරා කරු සංස්කෘතිය ගැන සිහි කරමින් සිංහල ව්‍යාකරණ රීති සකස් කළ බැව් කීම යුක්ති සහගත නොවේ. මෙම අර්ථ කථනය සිදතේ මූලික ධාරණාවට පටහැනි බව පැවසුණේ එබැවිනි.

(1) සිදත් සඟරාවේ ඇති දුබලතාවට ප්‍රධාන හේතුව වශයෙන් සමහරු පවසන්නේ කුමක් ද?

(2) සිදත් සඟරා කතුවරයාගේ අරමුණු කුමක් විය හැකිද?

(3) කව්ලැකිය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(4) කතුවරයාගේ මූලික ධාරණාව කුමක් ද?

(5) සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ සඳහන් මතවාදය ලියන්න.

(05) පහත දැක්වෙන විස්තරය පදනම් කොටගෙන දැන්වීමක් සකස් කරන්න.

අනුරාධපුර, කඳුපාගම විද්‍යාලය විසින් සාහිත්‍ය මාසය නිමිත්තෙන් දින දෙකක පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීමට සූදානම් කර ඇත. එය 2020 සැප්තැම්බර් 16, 17 යන දෙදින තුළ පැවැත් වේ. දේශීය මෙන් ම විදේශීය සම්මානලාභී නවකතා, කෙටිකතා, සාහිත්‍ය කෘති, කවි, විෂයානුබද්ධ පොත්, ළමා පොත්, මෙන් ම වෙනත් විශේෂ ග්‍රන්ථ ද 30% වට්ටමක් යටතේ ඔබට මිල දී ගැනීමට හැකිය. එමෙන් ම සැප්තැම්බර් 17 දින පෙ.ව. 9.00 ට ප්‍රවීණ ගත්කතුවර නන්දන අමරවීර මහතාගේ විශේෂ සාහිත්‍ය දේශනයක් ද විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත් වේ.

**නැතහොත්**

කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින උග්‍ර වන අලි උවදුර නිසා මිනිස් ජීවිත හානි, වගා හානි හා දේපළ හානි දිනෙන් දින වැඩි වන බවත් මෙයට පිළියමක් ලෙස වන අලි ප්‍රවේශ වීම වැළැක්වීමට ඉගිණිමිටිය ජලාශ ප්‍රදේශයේ වන රක්ෂණ භූමියට මායිම් ව විදුලි වැටක් ඉදිකිරීමේ අවශ්‍යතාවයක් පවතින බවටත් ''මතුගම'' උදාර සුහ සාධක සමිතියේ මාසික සභා රැස්වීමේ දී තීරණය විය.

මෙම අලිවැට ඉදිකිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරමින් කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් වෙත යවන ලිපිය ලියන්න. ඔබ ''උදාර'' සුහ සාධක සංගමයේ ලේකම් සුපුන් විතාන යැයි සිතන්න.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පන්සියපනස් ජාතක පොත ලියූ යුගය කුමක් ද?
(ආ) පන්සියපනස් ජාතක පොත ලිවීමට මූලාශ්‍ර කරගත් කෘතිය කුමක් ද?

(ii) මිනිසුන් ඉවුරුවල යන එන අඩි සද්දෙන්
ළයයට සසළ බව මීන් මතු නොනැගෙද්දෙන්
.....................................................................................
.....................................................................................
(අ) ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) ඉහත පද්‍ය නිර්මාණයේ රචකයා කවුරුන් ද?

(iii) ''හිස් බැල්මෙන් බලාගත් අත බලාගෙන අතක් පයක් නොසොල්වා පැය ගණනක් එකතැනකට වී හිඳිති.''
(අ) ඉහත පාඨය ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතියේ අනුවර්තකයා නම් කරන්න.

(iv) (අ) එස්. මහින්ද හිමි ලියූ ජාතිකාභිමානී කෘති දෙකක් ලියන්න.
(ආ) එස්. මහින්ද හිමි ලියූ මුල්ම කාව්‍ය කෘතිය කුමක් ද?

(v) ''ඇය විඳුනා දුක් මට නුරුස්සී''
(අ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතිය රචනා වූ යුගය කුමක් ද?

(vi) (අ) අපට වැසිකිළියක් කෙටි කතාවේ රචකයා කවුරුන් ද?
(ආ) එම රචකයාගේ මුල්ම කෙටිකතා සංග්‍රහය කුමක් ද?

(vii) ''මේවායින් ඔයාට ඕන එකක් තෝරාගන්න.''
(අ) මෙම ප්‍රකාශය ඇතුළත් කෙටි කතාවේ පරිවර්තකයා කවුරුන් ද?
(ආ) මෙම ප්‍රකාශය කරනු ලබන අය කවුරුන් ද?

(viii) නුදුරුව සිහිලැ ලීය ගඟු ලැ ලීය
වටසැදි මල් වැලීය සුදු වැලීය
පිපිවන සිටි මලීය වන මලීය
තුටුවන සිතුවිලීය පුල් විලීය
(අ) මෙම පද්‍ය ඇතුළත් කාව්‍ය කෘතිය කුමක් ද?
(ආ) එම කෘතියේ රචකයා කවුරුන් ද?

(ix) දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
යළි ඉපදී ඇති මවු දෙරණේ.......
(අ) ඉහත පද්‍ය කොටස ඇතුළත් පද්‍ය නිර්මාණය උපුටාගත් කාව්‍ය සංග්‍රහය කුමක් ද?
(ආ) මහගමසේකරයන්ගේ සිනමාවක් බවට පත් වූ නවකතාව කුමක් ද?

(x) වැසි සමේ රෑ ඇඳේ සිහිනයක් වී ඉන්න
ඔබ එන්න ඉතින් මගෙ හෙට දවස මට දෙන්න.
(අ) ඉහත පද්‍ය කොටස ඇතුළත් පද්‍ය නිර්මාණය කුමක් ද?
(ආ) එම පද්‍ය නිර්මාණයේ රචකයා කවුරුන් ද?

(02) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''නුවණැත්තෝ නම් මහෞෂධ පණ්ඩිතයෝ මතු නොවෙති. මමත් මහා නුවණැත්තෙමි. එක් ලෙසකින් ඔහු පරදවා පියම්හ'යි කීය.''

(අ) මෙම පාඨයෙහි අදහස සරල බසින් ලියන්න.

(ආ) මේ හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) **අනුවණකම්** කෙළේ
ගුරුන් ගුණ සිහි නොකෙළේ
නද ඉන් නො පතළේ
**අයස** මය මුළු දියත පතළේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) සමස්ත කවියෙහි අර්ථය ලියන්න.

(iii) ''ඔව් ඕකට ගිය කෙනෙක් ආයෙ එන්නෙ නෑ උඹ පලයන් ළමයා ආපහු ගමට.''

(අ) මෙය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් කා හටද?

(ආ) මෙම ප්‍රකාශයේ ''ඕකට'' යනුවෙන් සඳහන් කර ඇත්තේ කුමකට ද?

(iv) මේ රුදු දෝසා කළ මේ දේ
මා පුතු නොතකා විපාකේ
**මුවපත් වූයේ**
නියත විනාසේ
මේ මොහොතේ කිම් කරනෙම්දෝ
**මුළා වී** මඟ නොපෙනේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) මෙවැනි ප්‍රකාශයක් කිරීමට හේතු වූ කාරණය කුමක් ද?

(v) ''එදා මා නින්දට ගියේ ද ගමට පැමිණි අමුත්තා ගැන සිතමිනි.''

(අ) ගමට පැමිණි අමුත්තා කවුරුන් ද?

(ආ) මෙහි සඳහන් අමුත්තා ගමට පැමිණියේ කුමක් සඳහා ද?

(03) අමාවතුර කතුවරයා

(i) භාෂාව රසවත් ලෙස යොදා ඇති ආකාරයත්

(ii) අවස්ථා හා සිද්ධි නිරූපණය කර ඇති ආකාරයත් පිළිබඳව අඟුල්මල් දමනය කතාව ඇසුරින් ඇගයීමක් කරන්න.

**නැතහොත්**

(i) විවිධ අවස්ථා වර්ණනයෙහිලා කතුවරයා දැක්වූ සමත්කමත්,

(ii) විවිධ සමාජ ආර්ථික තොරතුරුත්,
'මගවිසිතුරු' පද්‍ය පන්තියෙන් හෙළිවෙයි. එක් කොටසකට උදාහරණ දෙකක් දක්වමින් පැහැදිලි කරන්න.

(04) (i) සුප්පාදේවිය දැඩි මානසික ගැටලුවක යෙදී සිටි ආකාරයත්,

(ii) සිංහබාහු එඩිතරව නිදහස සොයා යන ආකාරයත්,
සිංහබාහු නාට්‍යයෙන් මනාව නිරූපණය වෙයි. නිර්දිෂ්ට පාඩමෙන් උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

**නැතහොත්**

(i) පුද්ගල ජීවිත සාර්ථකත්වයට අවශ්‍ය ජීවිතාවබෝධයත්,

(ii) කාව්‍යාලංකාර යොදා ඇති ආකාරයත් නිසා උපදේශ කාව්‍ය රසවත් වී ඇත. ''හානා හීය පානා අඬ හැරෙන් දූනේ'' පද්‍ය පංතියෙන් උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(05) සමෘද්ධිමත් හෙට දිනක් පිළිබඳ අනාගත අපේක්ෂා දෑතේ කරගැට පද්‍ය නිර්මාණයෙන් පිළිබිඹු වේ. උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න.

(06) මැටිල්ඩාගේ චරිතය සජීවී ලෙස නිරූපණය කිරීමට කතුවරයා දක්වා ඇති සමත්කම උදාහරණ තුනක් දෙමින් විස්තර කරන්න.

(07) කුරක්කන් වගාවේදී ගොවියා වෙහෙස වී අභියෝග ජයගත් ආකාරය කුරක්කන් කවි තුළින් නිරූපණය වේ. ඔබට නියමිත පාඩමෙන් උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (2) | 11 - (4) | 21 - (2) | 31 - (2) |
| 2 - (4) | 12 - (4) | 22 - (1) | 32 - (4) |
| 3 - (1) | 13 - (3) | 23 - (4) | 33 - (3) |
| 4 - (4) | 14 - (1) | 24 - (4) | 34 - (4) |
| 5 - (1) | 15 - (3) | 25 - (2) | 35 - (1) |
| 6 - (3) | 16 - (2) | 26 - (4) | 36 - (2) |
| 7 - (2) | 17 - (1) | 27 - (1) | 37 - (3) |
| 8 - (3) | 18 - (4) | 28 - (3) | 38 - (2) |
| 9 - (1) | 19 - (1) | 29 - (2) | 39 - (4) |
| 10 - (2) | 20 - (4) | 30 - (1) | 40 - (1) |

## II කොටස

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

01 (i) (අ) අග - කෙළවර (ආ) අඟ - "අං" යන අර්ථය

(ii) (අ) මුඟු + පියළි (ආ) සම + උපකාර

(iii) (අ) විධි ක්‍රියා (ආ) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

(iv) (අ) උත්සන්න - සමනය, ප්‍රහීන (ආ) කයෝර - මිහිරි

(v) (අ) දුවැන්ත අලියෙක් අනුරාධපුර පුත්තලම් මාර්ගය හරස්කොට සිටියේ ය.

(ආ) මධ්‍යස්ථ පාලකයෙක් පහළ වේවා !

(vi) (අ) ඉක (ආ) අටි

(vii) (අ) පරපුටු (ආ) අත්තනෝමතික

(viii) (අ) ධර්ම සභාව / දම් සබය (ආ) ශිලා ලේඛන / සෙල් ලිපි

(ix) (අ) දඩයක්කරුවා විසින් සාවා ද මුවා ද මැරෙත් / මැරෙති / මරනු ලබති

(ආ) වෛද්‍යවරියක විසින් රෝගියා සුවපත් කරන ලදී / කරනු ලැබීය / කරනු ලැබුවේ ය / කෙරිණි

(x) (අ) ඖෂධ (ආ) දෙපාර්තමේන්තුව

02 රචනය - ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි.

1. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව ලකුණු 08
2. සංවිධානය, නිර්මාණාත්මක භාවය ස්වීයත්වය ලකුණු 12
3. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම ලකුණු 05

1. සාරවත්භාවය - ලකුණු 07

විස්තරයට අදාළව මාතෘකාව යොදා තිබීම - ලකුණු 01

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව වචන ගණන 250 සමීපව පැවතීම යන කරුණු මේ යටතේ සැලකිල්ලට ගත යුතුය.

2. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 12

මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතුය.

3. ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම - ලකුණු 05

වියරණ, අත් අකුරු, විරාම ලකුණු භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට ලිවීම, පද වෙන්කොට ලිවීම යන අංශ කෙරෙහි සැලකීම

03 ලකුණු විග්‍රහය (සාරාංශය)

1. අන්තර්ගතය (ප්‍රධාන අදහස් සඳහා) - ලකුණු 06
2. වචන ගණන - ලකුණු 02
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 02

අන්තර්ගතය

1. සෘහද සිත් පිනවන දෘශ්‍ය කාව්‍ය නාට්‍යයකි.
2. කවීත්වයේ අග්‍ර ඵලය නාටකය බව කියයි.
3. භේද නොමැතිව පොදුවේ විවිධ ඵල ලබා දීමට නාටකය සමත් ය.
4. සතුන්ගේ ක්‍රියා අනුකරණය නාට්‍යයේ මූල බීජයයි.
5. පුද පූජා විධිවලින් නාට්‍යය ප්‍රභව වූ බව සමහරු කියති.
6. නාට්‍යය, දුර්වල හදවත් ප්‍රබල කරමින්, වීර හදවත් තුළ වීරත්වය උද්දීපනය කරමින්, විදුවතුන්ගේ පාණ්ඩිත්‍යය ඔප්නංවයි.

04 පිළිතුර (අවබෝධය ප්‍රශ්නයට)

1. ඓතිහාසික සම්බන්ධය ගැන පැවති පූර්ව නිශ්චයන් බැවි සමහර මතයයි.
2. සංස්කෘත භාෂාවේ මහත් බලපෑම් ඔස්සේ යටපත් වෙමින් තිබූ හෙළ බසේ ලක්ෂණ පහදා දීම.
3. පද්‍ය ව්‍යවහාරය
4. කැළැල් නොවූ හෙළ බසේ ලකුණු කියා පෑම.
5. * සිංහල, සංස්කෘත, පාලි වැනි භාෂා හා සමීප සම්බන්ධතාවක් ඇති ව පැවතීම.
   * සකු, මගධ බස් වලින් පහළ වීම

05 පිළිතුරු (දැන්වීම සඳහා)

1. ආකෘතිය සඳහා - ලකුණු 04
2. අන්තර්ගතය සඳහා - ලකුණු 08
3. ශිල්පීය දක්ෂතා සඳහා - ලකුණු 03

1. ආකෘතිය - ආකර්ෂණීය ශීර්ෂය තිබිය යුතුය.
   නිර්මාණශීලී බව තිබිය යුතුය.
   දැන්වීම පලකරන්නාගේ නම, ලිපිනය තිබිය යුතුය.
   දිනය අවශ්‍ය වේ.
2. අන්තර්ගතය - පොත් ප්‍රදර්ශනය පැවැත්වෙන දිනය හා වේලාව
   පොත් ප්‍රදර්ශනය පැවැත්වෙන ස්ථානය
   වට්ටම් ලැබෙන කෘති
   සාහිත්‍ය දේශනය කරන්නේ කවුද?
   සාහිත්‍ය දේශනය කරන ස්ථානය
3. ශිල්පීය දක්ෂතා - නිවැරදි අක්ෂර වින්‍යාසය, පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම්, වියරණ, විරාම ලකුණු තිබිය යුතුය.

පිළිතුරු (රාජකාරි ලිපිය)

1. ආකෘතිය සඳහා - ලකුණු 04
2. අන්තර්ගතය සඳහා - ලකුණු 08
3. ශිල්පීය දක්ෂතා සඳහා - ලකුණු 03

## III කොටස

01 (i) (අ) කුරුණෑගල (ආ) ජාතකට්ඨකතාව

(ii) (අ) කෙකටිය ඕලු නළියන දිය රැළි මැද්දෙන්
මල් පෙති වියළි කොළ එන අතකට එද්දෙන් (ආ) එච්. එම්. කුඩලිගම කවියා

(iii) (අ) බැද්දේගම (ආ) ඒ. පී. ගුණරත්න මහතා

(iv) (අ) නිදහසේ දැහැන, නිදහසේ මන්ත්‍රය (ආ) ඔවාමුතු

(v) (අ) අමාවතුර (ආ) පොළොන්නරු යුගය

(vi) (අ) කේ. ජයතිලක මහතා (ආ) පුනරුත්පත්තිය සහ තවත් කෙටිකතා

(vii) (අ) කේ. පී. කරුණාතිලක මහතා (ආ) ෆොරෙස්ටියර් මහත්මිය

(viii) (අ) හංස සන්දේශය (ආ) වීදාගම මෛත්‍රී හිමි

(ix) (අ) ප්‍රබුද්ධ (ආ) තුංමංහංදිය

(x) (අ) වස්සානය (ආ) රත්නශ්‍රී විජේසිංහ මහතා

02 (i) (අ) නුවණ ඇත්තේ මහෞෂධ පණ්ඩිතයන්ට පමණක් නොවෙයි. මමත් විශාල නුවණක් ඇති අයෙක්මි. එක් ආකාරයකින් ඔහු පරදවමි. / පරාජය කරමි.

(ආ) කේවට්ට බමුණා මෙතෙක් ගෙන ආ උපායන් අසාර්ථක වූ විට බ්‍රහ්මදත්ත රජු ආපසු ඔවුන්ගේ නුවරට යම්හයි කී විට කේවට්ට බමුණා ධර්මයුද්ධයක් පවත්වන බව පවසන අවස්ථාව

(ii) (අ) අනුවණකම් - මෝඩකම් / මෝඩ වැඩක්
අයස - අපකීර්තිය

(ආ) ගුරුවරයාගේ යහපත් ගුණාංග සිහිනොකළ නිසා මෝඩ වැඩක් / අනුවණකමක් කර ගත්තේය. ඒ නිසා වීණාවේ නාදය පැතිර ගියේ නැත. මුළු ලෝකයේම පැතුරුණේ අපකීර්තියම ය.

(iii) (අ) හරක් බලමින් සිටි මහල්ලා / සීයා විසින් පුංචි මැණිකාට
(ආ) හිරගෙදරට

(iv) (අ) මුවපත් වූයේ - මුහුණදීමට සිදුව ඇත්තේ
මුළා වී - රැවටී / වරදවාගෙන
(ආ) සිංහබාහු පියාට එරෙහිවී ලෙන අතහැර නරවාසේ සොයා යාමට තීරණය කිරීම

(v) (අ) අපට වැසිකිළියක් කෙටිකතාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමා
(ආ) ගමෙහි නිවෙස්වල වැසිකිළි තැනවීම සඳහා

03 (i) භාෂාව රසවත් ව භාවිත කර ඇති ආකාරය

* පාලි භාෂාවට අනුගත වෙමින් නිරවුල් වූ සරල භාෂාවක් යොදාගෙන ඇත.
"කොසොල් රජුගේ භාර්ග නම් පුරෝහිතයා පිණිස මන්තාණි නම් බැමිණි ගව් ගෙනැ රෑ පුතෙකු ප්‍රසව කළා"
* වියත් වහර වෙනුවට පොදු ජන වහර යොදාගැනීම.
"ඇපි ඇන්නට හංසා නොකරන කුලයෙහි උපන්නම්හ. එසේ නොකට හැක්කැ."
* සංවාද මිශ්‍ර සජීවී භාෂාවක් යොදා ගැනීම.
"දවස් ගියසෙ සුවඳැ'යි පිළිවිත. රජ දවස් ගියසෙ නොසුවයැ' රෑ මාගේ මඟුල් අවි දිලිණ..."
* වර්ණනාත්මක භාෂාවක් යොදා ගැනීම
"හේ ධර්මාන්තේවාසික වැ ශිල්ප උගන්නි. වත් සපනැ. කී කී දූයක් වහා සපයයි. මන වඩන නියායෙන් හැසිරෙයි...."
* ශබ්දාලංකාරය දනවීමට සමත් අනුප්‍රාසාත්මක බස් වහරක් යොදා ගැනීම
"ගම් නොගම් කළේ. නියම්ගම් නොනියම්ගම් කළෙ. දනවු නොදනවු කළෙ"

(ii) අවස්ථා හා සිද්ධි නිරූපණය

* අහිංසක කුමාරයා ඉපදෙන අවස්ථාව
"සියලු නුවර ආයුධ දිලිණ. රජුගේ යහන්හි තුබු මඟුල් කඩුවද සෙසු අවිදූ දිලිණ"
* අහිංසක ශිල්ප ඉගෙනීමට ගිය අවස්ථාවේ සෙසු ශිෂ්‍යයන් ඔහු කෙරෙහි කටයුතු කළ ආකාරය
"ආචාර්යයා අඹුව හා සසග ඇත්තේ යැයි බිඳ පියයම්හ'යි බැණැ ගෙනැ...."
* අංගුලිමාල බුදුන් හමුවේ වෙහෙසට පත්වන අවස්ථාව ඝොර ක්ලාන්ත වියැ. මියෙහි කෙළ සැඳී ගියෙ ශරීරයෙන් ස්වේද බස්සී....
* අඟුල්මල් රහතන් වහන්සේ පිඬු සිඟා වැඩි අවස්ථාව
"මහ තෙරුන් කෙණෙසි අහර සිගන්නට වන් කල් හි බලු කපුටු ආදීන් නෙරනා සඳහා ...."

නැතහොත්

(i) විවිධ අවස්ථා වර්ණනයෙහිලා කතුවරයා දැක්වූ සමත්කම

* වලඳින අඳහසින් මෙන් සුරගඟ අඟන..... යන කවිය
* නිල තුරඟුට නැගෙමින් රිවි දෙව් සරිත..... යන කවිය
* සුර රද සටන් සමගින් සරඟන එ වර ...... යන කවිය

(ii) විවිධ සමාජ ආර්ථික තොරතුරු සඳහා

* නිල තුරඟුට නැගෙමින් රිවි දෙව් සිරින .... යන කවිය
* සන් නන් සිහින් ගෙඳි සෙවණලු වැලි තෙලෙන ..... යන කවිය
* අයි රාවණ වුවත් නවතන රිසින් එන .... යන කවිය
* මල්දම් සුවඳ දුම් දුන් සොඳ වරලසිනි ..... යන කවිය

04 (i) සුප්පා දේවිය දැඩි මානසික ගැටලුවක යෙදී සිටි ආකාරය

* "සඟවන්නට බැරිය පුතුගෙන්
මිඟිදා නිතින සොඳිනා පෙනෙන විලසා"
* "නැතිවේද සෙනේ
හැරයාද ලෙනෙ නොදනා"
* "මැණිය නුඹ දෙදෙනගෙ වේ
කුමරියක් මනා"
* "ඔබ පියාණන් නරයෙකු නොව වනයේදී මට හමු වූ සිංහරාජයෙකි."
* "වේ රුදු දෝසා කළ මේ දේ

මා පුතු නොතකා විපාසෝ
මුවපත් වූයේ
නිවත විනාසේ
මේ මොහොතේ කිම් කරනෙම් දෝ''

* ''යන්ට වේ දූන් සැමියා හැරා
වන වාසෙන් පුතු සමගා''

(ii) සිංහබාහු එඩිතරව නිදහස සොයා යන අයුරු
* ''සිංහයෙක් වේ මා පියා
ජන්මයෙන් ලත් මේ අරන්නේ''
* ''මටද හිමිවේ වංග රාජ්‍යය ප්‍රබල නරවර පරපුරෙන්''
''කුමක්දෝ මේ පාපේ ලෙනේ මේ විසීමේ සෙතක්දෝ''
* ''යන්ට දූන්නම් කාලෙ වේ මෑණියන් හා නැගෙණි සමගින්''
''වංග දේසේ වසන ජනතා කෙරෙහි වේ මා යුතුකමා''

නැතහොත්

(i) පුද්ගල ජීවිත සාර්ථකත්වයට අවශ්‍ය ජීවිතාවබෝධය ලබාදීම.
* වරද පෙනෙන තරමට වැරදුණා නොවේ.... යන කවිය
* ගොඩැල්ලේ තරම දූනගෙන ළිද කපනු.... යන කවිය
* අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා.... යන කවිය
* ඇස නැතිදා පොත ගත්තේ කියන්ටද.... යන කවිය

(ii) කාව්‍යාලංකාර යොදා ඇති ආකාරය
* සාම්ප්‍රදායික යෙදුම් - අප්තෝපදේශ භාවිතය
* ගසකට කෙටුම ගසමුල පැයුමෙන් දූනේ.... යන කවිය
''පනින රිළවුංට ඉනිමං කමක් නැත''
''යුද ඇති දා නැති කග කොස්කොටන්නද''
''පැණි වරකා ගසටත් හෙණ නොවදිද්ද''
''දුවන මුවන් දූක නොදමන් නෙළුව පලා''

උපමා භාවිතය
* එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා .... යන කවිය

විධික්‍රියා පද - වියරණ විධි භාවිතය
* ''ගොඩැල්ලේ තරම දූනගෙන ළිද කපනු''.... යන කවිය

05 සමෘද්ධිමත් හෙට දිනක් පිළිබඳ අනාගත අපේක්ෂා
* දැතේ කරගැට සිඹ සනසන්නට .... යන කවිය
* අඩසඳ මෝරන මැදියම් අහසින් .... යන කවිය
* දෑසේ කඳුළැලි පිසදා බලනෙම් .... යන කවිය
* දෙදහස් පන්සිය වසරක් තිස්සේ .... යන කවිය

06 මැටිල්ඩාගේ චරිතය සජීවී ලෙස නිරූපණයට කතුවරයා දක්වූ සමත්කම
* ''ඇය සිතින් ජීවත් වූයේ තමාට තරම් නොවන පහත් විවාහයකට මැදිහත් වූ එකියක මෙන් අසන්තෝෂයෙනි.''
* ''ස්ත්‍රීන් සම්බන්ධයෙන් කුලය හා පන්තිය වෙනුවට ක්‍රියා කරන්නේ ඔවුන්ගේ රූ සපුව, හාවභාවලීලා හා ලලිත කාන්තා ගතිගුණ වන හෙයිනි.''
* ''තමා ඉපදී ඇත්තේ සියලුම සැපසම්පත් හා සුඛ විහරණ ආස්වාදනය කිරීමටය යන හැඟීම නිසා ඈ නිරන්තරයෙන් දුක් වේදනාවලට භාජනය වූවාය.
* ''ඇයට ඇඳුම් පැළඳුම් හෝ මුතු මැණික් කිසිවක් නොතිබුණේය. එහෙත් ඇය ආශා කළේද ඒවාටමය.''
* ''ඕකෙන් මට මොකක් කරන්ඩ කියලද කියන්නෙ.''
* ''කනේ කරේ දාගන්න මොකුත්ම නැතිකම ගැනයි මං මේ දවස් ටිකේම කල්පනා කර කර හිටියෙ.''

ඉහත නිදසුන්වලට අමතරව ගැළපෙන වෙනත් නිදසුන් ද පිළිගන්න.

07 කුරක්කන් වගාවේදී ගොවියා වෙහෙස වී අභියෝග ජයගත් ආකාරය.
* දුරුතු මහේදී කැලයට වැදිලා .... යන කවිය
* එල්ලවෙන්ට කවිකර කීවෙමි බොහොම .... යන කවිය
* මා කී දේ දෙයියනි බොරුවක්ම නැති .... යන කවිය
* මෙදා හේනේ පැහිලා ඇති කුරක්කන් .... යන කවිය